# ශ්‍රී හර්ෂදේවයන්ගේ නාට්‍ය ත්‍රිත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඩබ්. ඒ. රිෂාදි මනෝජා හර්ෂණී[1]

ශ්‍රී හර්ෂදේවයන්ගේ නාට්‍ය ත්‍රිත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයේ මූලික පරමාර්ථය වනුයේ ශ්‍රී හර්ෂදේවයන්ගෙන් සංස්කෘත නාට්‍ය කේෂත්‍රයට කෙබඳු ආලෝකයක් ලැබුණේ ද යන්න විමසාබැලීම යි. සංස්කෘත නාට්‍ය පිළිබඳ අධ්‍යනයන් සිදු කෙරුණ ද එක් නාට්‍යකරුවකු අරමුණු කොටගෙන රචිත කෘතීන් පිළිබඳ කේවල අධ්‍යයනයන දුලබ ය. මෙබඳු  ක්ෂේත්‍රයක් පිළිබඳ විමර්ශනය කිරීමට මූලික හේතුව ද මෙය වේ. සංස්කෘත නාට්‍ය පිළිබඳ විමර්ශනාත්මක කෘතියක් ලෙස පාඨක විචාරක සම්භාවනාවට පාත්‍ර වී ඇත්තේ මහාචාර්ය ජයදේව තිලකසිරිගේ 'සංස්කෘත නාට්‍ය සාහිත්‍යය' නම් කෘතිය යි. එසේ ම ආචාර්ය එල්. සිංගල්ගේ 'ඇරිස්ටෝටල් සහ භාරත' කෘතිය ද නාට්‍ය මූලධර්ම සසඳමින් රචනා වී ඇත. ශ්‍රී හර්ෂදේවයන්ගේ නාට්‍ය ත්‍රිත්වය පිළිබඳ ව විමර්ශනාත්මක අධ්‍යයනයකින් තොරතුරු ලබාගැනීමේ ප්‍රධාන මූලාශ්‍රය වූයේ පුස්තකාල ග්‍රන්ථ පරිශීලනය කිරිම යි. ප්‍රාථමික මූලාශ්‍රය ලෙස රත්නාවලී, ප්‍රියදර්ශිකා හා නාගානන්ද නාට්‍ය පෙළ ද ද්විතීයික මූලාශ්‍රය ලෙස විචාරාත්මක ග්‍රන්ථ ද තෘතීයික මූලාශ්‍රය ලෙස වාර සඟරා ද බෙහෙවින් දායක විය. ශ්‍රී හර්ෂදේවයන්ගේ නාට්‍ය ත්‍රිත්වය වන රත්නාවලී, ප්‍රියදර්ශිකා හා නාගානන්ද නාට්‍යයන්හි භාවිත ශිල්ප ධර්ම කාලිදාස වැනි පූර්වකාලීනයන්ගෙන් ලද නොමඳ ආභාසය මෙකී නාට්‍ය ත්‍රිත්වයෙහි දී කතුවරයා හෙළන ලද දෘෂ්ටිය සේ ම සංස්කෘත නාට්‍ය රචනයේ දී භරතමුනි නිර්දේශ කළ සංස්කෘත නාට්‍ය රීති හර්ෂදේවයන් අතික්‍රමණය කළ අයුරු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කර ඇත. එසේ ම සහිත්‍යය කෘතියක් ලෙස කාලීන සමාජ, ආර්ථික, දේශපාලනික, සංස්කෘතික තොරතුරු හර්ෂදේවයන්ගේ නාට්‍ය ත්‍රිත්වයෙන් හෙළි කෙරෙන අයුරු කෘතියෙහි අන්තර්ගත වේ. එසේ ම භාෂා භාවිතයේ දී හර්ෂදේවයන් පළ කළ කෞශල්‍ය පිළිබඳ අධ්‍යයනයක් ද මෙහි සිදු කර තිබේ. මේ ආකාරයට ශ්‍රී හර්ෂදේවයන් සංස්කෘත නාට්‍ය ක්ෂේත්‍රයට දායාද කළ නාට්‍ය ත්‍රිත්වය සංස්කෘත නාට්‍ය සාහිත්‍යට ආලෝකයක් ලබාදුන් බව නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පදඃ** හර්ෂදේව, භරතමුනි, සංස්කෘත නාට්‍ය, නාට්‍ය රීති

[1] සිංහල අධ්‍යයනාංශය